# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2481/16 – 2026 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා – 2026.03.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2004 දෙසැම්බර් මස 01 වන දින අංක 1369/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2004 අංක 153 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද, 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

කේ.ඩී. ලාල් කාන්ත,<br>
කෘෂිකර්ම, පශු සම්පත්,<br>
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 13/99/VEP/223-1<br>
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය : KDS/HAT/4/1/2/AQ/01.

2026 පෙබරවාරි මස 12 වැනි දින,<br>
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,<br>
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,<br>
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියැද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 334 - කලෝටුවාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කලෝටුවාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක අවසාන ගම් පිඹුරු 176 හා 2005.08.30 දිනැති අවසාන ගම් පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටස් වලට මායිම්:

01. **කැබලි අංක 324 - හත්බැවවත්ත - ප්‍රමාණය : හෙක්. 10.1275**

**උතුරට:** අ.ග.පි. 176හි කැබලි අංක 49, 64, 66, 222, 223, 224 සහ 70; **නැගෙනහිරට:** අ.ග.පි. 176හි කැබලි අංක 72 (ටොක්කාපත ඇළ), 73 සහ 74; **දකුණට:** අ.ග.පි. 176හි කැබලි අංක 75, 76, 78, 83 සහ 49; **බටහිරට:** අ.ග.පි. 176හි කැබලි අංක 49.

EOG 03-0209